සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

**Provincial Department of Education - NWP**

**තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023**

**Third Term Test - Grade 08 - 2023**

# ගණිතය - I

**කාලය පැය 02 යි**


**නම / විභාග අංකය:** ..............................................................................................................

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු 2 බැගින් හිමි වේ.

01. සාධාරණ පදය 2n වූ සංඛ්‍යා රටාවේ මුල්පද හතර ලියන්න.


02. සුළු කරන්න. $2x - 3y - 5x + y$

03. රූපයෙහි පරිමිතිය සොයන්න.





04. සුළු කරන්න. $\frac{3}{4} \times 1\frac{3}{5}$


05. පහත දැක්වෙන ටෙසලාකරණ අතුරින් ශුද්ධ ටෙසලාකරණ තෝරා යටින් ඉරක් අඳින්න.



(i)



(ii)




(iii)

06. සුළු කරන්න. $(x^3)^2$

---

07. රූපයේ දැක්වෙන තොරතුරු අනුව $x$ හා $y$ හි අගය සොයන්න.




---

08. කෙසෙල් ඇවරියක ස්කන්ධය 1.25kg වේ. එවැනි කෙසෙල් ඇවරි 12ක ස්කන්ධය සොයන්න.

---


09. විසඳන්න. $2x - 1 = 7$

---

10. රුපියල් 8000 ක මුදලක් විශ්ව හා සුරනිමල අතර 9 : 7 අනුපාතයට බෙදූ විට විශ්වට ලැබෙන මුදල සොයන්න.

---

11. රූපයේ දැක්වෙන තොරතුරු අනුව ABC Δ යේ වර්ගඵලය සොයන්න.





---

12. P = { 2, 3, 5, 7 } කුලකය වේ

i. n(p) වල අගය ලියන්න.

ii. 3 ........... P හිස්තැනට සුදුසු පරිදි ∈ හෝ ∉ හෝ යොදන්න.

13. $-2 < x \leq 2$ අසමානතාව පහත සංඛ්‍යා රේඛාවක නිරූපණය කරන්න.




---

14. 50 දෙනෙකුගෙන් යුත්ත පන්තියක 20 දෙනෙකු පිරිමි ළමයි නම් ගැහැණු ළමුන් ගණන මුළු සිසුන්ගේ ප්‍රතිශතයක් ලෙස ලියන්න.

---

15. වෘත්තය සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් නිවැරදි ප්‍රකාශය සඳහා ( ✓ ) ලකුණ ද වැරදි ප්‍රකාශය සඳහා ( ✗ ) ලකුණ ද යොදන්න.


| | |
|---|---|
| වෘත්තයක අරයන් දෙකකින් හා චාප කොටසකින් මායිම් වූ පෙදෙස කේන්ද්‍රික ඛණ්ඩයයි. | |
| විෂ්කම්භයක් මගින් සුළු වෘත්ත ඛණ්ඩ හා මහා වෘත්ත ඛණ්ඩ වශයෙන් වෙන්වේ. | |
| අරයන් දෙකක එකතුව විශ්කම්භයට සමාන වේ. | |

---

16. ධාරිතාව $15l$ වූ ටැංකියක ඉන්ධන $7l\ 250ml$ ඇත. ටැංකිය සම්පූර්ණයෙන් පිරවීමට තවත් කොපමණ ඉන්ධන ප්‍රමාණයක් එයට දැමිය යුතුද?

---

17. O හි සිට උ $50^0$ බ දෙසින් 25m දුරින් පිහිටි ස්ථානය දළ රූප සටහනින් දක්වන්න.



18. පන්තියක සිසුන්ගේ දින 10 ක පැමිණීම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

25, 42, 32, 28, 25, 40, 38, 24, 25, 35

සිසුන්ගේ පැමිණීමේ,

i. මාතය

ii. මධ්‍යස්ථය සොයන්න.

---

19. 1 : 50000 පරිමාණයට ඇඳ ඇති සිතියමක නගර දෙකක් අතර දුර 4 cm කි. නගර දෙක අතර සැබෑ දුර සොයන්න.

---

20. මල්ලක් තුල රතු පබළු 5ක් ද නිල් පබළු 3ක් ද ඇත. අහඹු ලෙස පබළුවක් ගත්විට එය නිල් පබළුවක් වීමේ සම්භාවිතාව සොයන්න.

# ගණිතය - II

- පළමු ප්‍රශ්ණය ඇතුලුව තවත් ප්‍රශ්ණ 4 කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්ණයට ලකුණු 16 ක් ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 11 බැගින්ද හිමිවේ.

---

01. a) ඔබේ ගුරුතුමාගේ/ගුරුතුමියගේ උපදෙස් අනුව 3cm, 4cm, 5cm, 7cm, 9cm දිග වූ ඉරටු කැබලි භාවිතාකර ත්‍රිකෝණ සැකසීමට අදාල ක්‍රියාකාරකම සිහි කරන්න.
පහත දැක්වෙන වගුව ඔබේ ලිපිතුරු පත්‍රයේ පිටපත් කරගෙන ක්‍රියාකාරකම සඳහා භාවිතාකල ඉරටු කැබලි 3ක් ගෙන එම ඉරටු කැබලි කෙළවරවල් හමුවන පරිදි ත්‍රිකෝණයක් සකස්කල හැකිවූ අවස්ථා අනුව වගුවේ හිස්තැන් සම්පූර්ණ කරන්න.

| එක් එක් ඉරටු කැබැල්ලේ දිග cm | ඉන් ඉරටු කැබලි 2ක දිගවල එකතුව cm | තුන්වන ඉරටු කැබැල්ලේ දිග cm | දෙවන තීරයේ සහ තුන්වන තීරයේ ඇති අගයන් අතර සම්බන්ධය | ත්‍රිකෝණයන් සැකසිය හැකි නම් ✓ද නොහැකිනම් × ලකුණද යොදන්න |
|---|---|---|---|---|
| 3, 4, 5 | 7<br>9<br>8 | 5<br>3<br>4 | 7 > 5<br>.............<br>............. | ............................. |
| 3, 4, 9 | 7<br>..................<br>.................... | 9<br>3<br>4 | 7 < 9<br>.............<br>............... | × |

(ලකුණු 6)

b) i. AB = 5cm, BC = 7cm හා AC = 8cm වන සේ ABC ත්‍රිකෝණය අඳින්න. (ලකුණු 3)


ii. $A\hat{B}C$ හි අගය මැන ලියන්න. (ලකුණු 2)

iii. ඉතිරි කෝණ දෙකෙහි එකතුව මැනීමෙන් තොරව ලබා ගන්න. (ලකුණු 3)

iv. ඉහත iii හි අගය ලබාගැනීමට භාවිතාකල ප්‍රමේය ලියන්න. (ලකුණු 2)

---

02. පියන නොමැතිව වීදුරු වලින් තනන ලද ඝණකයක හැඩයකින් යුත් කුඩා මාළු ටැංකියක් රූපයේ දැක්වේ.




i. මාළු ටැංකියේ පිටත පෘෂ්ඨ වර්ගඵලය සොයන්න. (ලකුණු 3)


ii. ටැංකියේ පරිමාව සොයන්න. (ලකුණු 2)

iii. මාළු ටැංකිය සම්පූර්ණයෙන් පිරවීමට අවශ්‍ය ජලය $l$ හා $ml$ වලින් සොයන්න. (ලකුණු 3)

iv. ජලය $1l\ 152ml$ ප්‍රමාණයක් මාළු ටැංකියට දැමූ විට ජල කඳේ උස සොයන්න. (ලකුණු 2)


03. a) i. රූපයේ දැක්වෙන තොරතුරු අනුව $x^0$ හා $y^0$ අගයන් සොයන්න. (ලකුණු 4)

ii. පරිපූරක බද්ධ කෝණ යුගලක් ලියන්න. (ලකුණු 2)





b) i. ඕනෑම බහු අස්‍රයක බාහිර කෝණවල ඓක්‍යය කීයද? (ලකුණු 2)

ii. $x$ හි අගය සොයන්න. (ලකුණු 3)





---

04. a) i. සංඛ්‍යා රේඛාව මත ලකුණු කර ඇති අසමානතාව ලියා දක්වන්න. (ලකුණු 2)




ii. $x \geq -2$ අසමානතාවෙහි පූර්ණ සංඛ්‍යාමය විසඳුම් කුලකය සංඛ්‍යා රේඛාවක් මත දක්වන්න. ඒ අනුව $x$ ට ගත හැකි අවම ධන පූර්ණ සංඛ්‍යාව කුමක්ද? (ලකුණු 3)

b) i. P, Q, R, සහ S ලක්ෂ්‍යවල ඛණ්ඩාංක ලියා දක්වන්න (ලකුණු 4)




ii. සුදුසු කාටීසීය තලයක් මත $x = -2$ සරල රේඛාව අඳින්න. (ලකුණු 2)

05. a) පහත වෘන්ත පත්‍ර සටහනෙහි දැක්වෙන්නේ කම්බි කැබලි කිහිපයක දිග ආසන්න සෙන්ටිමීටරයට මැනීමෙන් ලද තොරතුරුය.

| වෘන්තය | පත්‍රය |
|---|---|
| 10 | 0, 4 |
| 11 | 1, 3, 4, 9 |
| 12 | 1, 2, 4, 7, 8 |
| 13 | 1, 3, 3, 5, 6, 9 |
| 14 | 2, 5, 6, 7, 8 |
| 15 | 1, 2, 4 |

i. මෙහිදී මැනීමට ගත් මුළු කම්බි කැබලි ගණන කීයද? (ලකුණු 2)

ii. මෙම තොරතුරුවල පරාසය සොයන්න. (ලකුණු 2)

iii. මධ්‍යස්ථය සොයන්න (ලකුණු 2)

iv. මාතය කුමක්ද? (ලකුණු 2)

v. මෙහිදී මාතය වන කම්බි කැබැල්ලේ දිගට වඩා ඇති කම්බි කැබලි ගණන කොපමණද? එය ප්‍රතිශතයක් ලෙස දක්වන්න. (ලකුණු 3)

---

06. a) සුළු කරන්න.

i. $3\frac{3}{7} \times 2\frac{5}{8}$ (ලකුණු 2)

ii. $18 \div 7\frac{1}{5}$ (ලකුණු 2)

b) එක්තරා මුදලක් නිරෝෂ් හා අරවින්ද අතර 2 : 3 අනුපාතයටද අරවින්ද සහ අහමඩ් අතර 4 : 1 කට දුනි. අහමඩ්ට රු. 1,200 ක් ලැබුණි.


i. නිරෝෂ්, අරවින්ද සහ අහමඩ් අතර බෙදා දිය යුතු පොදු අනුපාතය සොයන්න. (ලකුණු 3)

ii. තිදෙනා අතර බෙදා දුන් මුළු මුදල සොයන්න. (ලකුණු 2)

iii. අරවින්දට ලැබුණු මුදල සොයන්න. (ලකුණු 2)

---

07. a) රූපයේ දැක්වෙන්නේ ගොඩනැගිල්ලක බිම් සැලැස්මක පරිමාණ රූපයකි. මෙය ඇඳ ඇත්තේ 1 : 500 පරිමාණයටයි.




A - සමචතුරස්‍රාකාර කාර්යාලය
B/C - දිගින් සමාන වූ පන්තිකාමර

i. පන්ති කාමරයක සැබෑ දිග සොයන්න. (ලකුණු 3)

ii. පන්ති කාමරයක වර්ගඵලය සොයන්න. (ලකුණු 3)

b) ක්‍රිෂ්ණ තම නිවසේ සිට නැ. $30^0$ ද 600m ගමන් කර නගරය වෙත ගොස් එතැන් සිට උ. $25^0$ නැ වූ දිශාව ඔස්සේ 20m ගමන් කර තැපැල් කාර්යාලය වෙත ලඟා වේ. මෙම තොරතුරු වලට අනුව දළ සටහනක් අඳින්න. (ලකුණු 5)


Download Term Test Papers, Short Notes From One Place!

(8) WWW.PastPapers.WiKi (8)
Download Term Test Papers, Short Notes From One Place!

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP



තෙවන වාර පරීක්ෂණය - 08 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 08 - 2023

# ගණිතය

**පිළිතුරු පත්‍රය**

## I කොටස

| | | | |
|---|---|---|---|
| 1. | 2, 4, 6, 8 | | 2 |
| 2. | $-3x - 2y$ | | 2 |
| 3. | 5 x 5<br>25*cm* | 1<br>1 | 2 |
| 4. | $\frac{3}{\cancel{4}} \times \frac{\cancel{8}\,2}{5}$<br>$\frac{6}{5} = 1\frac{1}{5}$ | 1<br>1 | 2 |
| 5. | i හා iii | | 2 |
| 6. | $x^{3x2}$<br>$x^{6}$ | 1<br>1 | 2 |
| 7. | $x = 50^0$<br>$y = 25^0$ | 1<br>1 | 2 |
| 8. | 1.25 x 12<br>15kg | 1<br>1 | 2 |
| 9. | $2x - 1 + 1 = 7 + 1$<br>$\frac{2x}{2} = \frac{8}{2}$<br>$x = 4$ | 1<br><br>1 | 2 |
| 10. | $\frac{\cancel{8000}^{500}}{\cancel{16}} \times 9$<br>රු. 4500 | 1<br>1 | 2 |
| 11. | $\frac{1}{2} \times 8 \times 5$<br>$20cm^2$ | 1<br>1 | 2 |

| | | | |
|---|---|---|---|
| 12. | $n(p) = 4$<br>$3 \in P$ | 1<br>1 | 2 |
| 13. |  | | 2 |
| 14. | $\frac{30}{50} \times 100\,\%$<br>60% | 1<br>1 | 2 |
| 15. | ✓<br>✗<br>✓ | | 2 |
| 16. | 15 000<br>− 7 250<br>7*l* 750*ml* | 1<br>1 | 2 |
| 17. |  කෝණය<br>දුර | 1<br>1 | 2 |
| 18. | 25<br>30 | 1<br>1 | 2 |
| 19. | 1cm ⟶ 500m<br>4 x 500 = 2000m<br>2km | 1<br><br>1 | 2 |
| 20. | $\frac{3}{8}$ | | 2 |




(2) WWW.PastPapers.WiKi (1)




Download Term Test Papers, Short Notes From One Place!

# II කොටස

| | | | |
|---|---|---|---|
| a) | 9 > 3 ✓<br>8 > 4<br><br>13 3 13 > 3<br>12 4 12 > 4 | | 6 |
| b) i.<br>ii.<br>iii.<br>iv. | ත්‍රිකෝණ ඇඳීම<br>අගය මැනීම<br>$180^0$ - අගය = පිළිතුර<br>ප්‍රමේය ලිවීම | 3<br>2<br>3<br>2 | <br><br><br>10<br>16 |
| 2. i. | 12 x 12 = 144<br>144 x 6<br>864 $cm^2$ | 1<br>1<br>1 | 3 |
| ii. | 144 x 12<br>1728 $cm^3$ | 1<br>1 | 2 |
| iii. | 1728$ml$<br>1$l$ 728 $ml$<br><br>$\frac{1152}{144}$ = 8$cm$ | 1<br>2 | 3<br><br>3<br>11 |
| 3. a) i. | x = $90^0$ - $48^0$<br>= $42^0$<br>y = $180^0$ - $48^0$<br>= $132^0$ | 1<br>1<br>1<br>1 | 4 |
| ii. | $\hat{ADE}$ හා $\hat{EDC}$ | 2 | 2 |
| b) i. | $360^0$<br><br>2$x$ + 190 = $360^0$<br>2$x$ = $170^0$<br>$x$ = $85^0$ | 2<br><br>1<br>1<br>1 | <br><br><br><br>3<br>11 |
| 4. a) i. | -2 ≤ x < 3 | 2 | 2 |
| ii. |  | 2 | |
| b) i. | $\underline{\underline{1}}$<br>P (-3, -2)<br>Q (-2, 1)<br>R (2, 1)<br>S (0, -2) | 1<br><br><br><br>4 | 3<br><br><br><br>4 |
| ii. |  | 2 | 2<br>11 |





| | | | |
|---|---|---|---|
| 5. a) i.<br>ii. | 25<br>154 - 100<br>54 | 2<br><br>2 | 2<br><br>2 |
| iii. | $\frac{26}{2}$ = 13 වැනි<br>133 | 1<br>1 | <br>2 |
| iv.<br>v. | 133<br>11<br>$\frac{11}{25}$ x 100%<br>44% | 2<br>1<br><br>1 | 2<br><br>1<br>3<br>11 |
| 6. a) i. | $\frac{\cancel{24}^{3}}{\cancel{7}_{1}}$ x $\frac{\cancel{21}^{3}}{\cancel{8}_{1}}$<br>9 | 1<br>1 | 2 |
| ii. | 18 ÷ $\frac{36}{5}$<br>$\cancel{18}^{1}$ x $\frac{5}{\cancel{36}_{2}}$<br>$2\frac{1}{2}$ | <br><br>2 | <br><br>2 |
| b) i. | නිරෝෂ : අරවින්ද : අහමඩ්<br>2 : 3 :<br>4 : 1<br>8 : 12 : 3 | <br><br><br>3 | <br><br><br>3 |
| ii. | $\frac{1200}{3}$ = 400<br>400 x 23<br>9200/-<br><br>400 x 12<br>4800/- | 1<br><br>1<br><br>1<br>1 | <br><br>2<br><br><br>2<br>11 |
| 7. a) i. | 1cm ⟶ 5m<br>10.4<br>-2.4<br>8.0 ÷ 2 = 4 cm<br>සැබෑ දිග = 4 x 5 = 20 m | 1<br><br><br>1<br>1 | <br><br><br><br>3 |
| ii. | පළල = 2.4 x 5 = 120 m<br>වර්ගඵලය 20 x 12<br>240 $m^2$ | 1<br>1<br>1 | <br><br>3 |
| b) |  | | 5<br>11 |



PAST PAPERS WIKI
(2) WWW.PastPapers.WiKi (2)



Download Term Test Papers, Short Notes From One Place!


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න